ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

இலங்கை கடற்றொழில் நீரக வலமூளங்கள் அபிவிருத்தி அமைச்சு

MINISTRY OF FISHERIES & AQUATIC RESOURCES DEVELOPMENT

වාර්ෂික වාර්තාව

வருடாந்த அறிக்கை

ANNUAL REPORT

2014

ලංකා ධීවර සංස්ථාව

இலங்கை கடற்றொழில் கூட்டுதாபனம்

Ceylon Fisheries Corporation

පටුන

	පිටුව
• ලංකා ධීවර සංස්ථාව පිහිටුවීම හා නීතිමය ව්‍යුහය	01
• සාංගමික තොරතුරු	02-03
• දැක්ම හා මෙහෙවර	04
• ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා වෙත භාරදෙන ලද ලිපිය	05
• සභාපතිගේ සමාලෝචනය	06-07
• අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව	08-10
• විගණකාධිපතිගේ වාර්තාව	11-24
• විගණකාධිපති වාර්තාවට අදාල පිළිතුරු ලිපිය	25-34
• මූල්‍ය තත්ත්ව ප්‍රකාශය	35
• විස්තීර්ණ ආදායම් ප්‍රකාශය	36
• මුදල් ප්‍රවාහ ප්‍රකාශය	37
• ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය	38
• ගිණුම් සටහන්	39-50
• ආංශික විස්තීරණ ආදායම හා මධ්‍යම පරිපාලන පොදුකාර්ය පිරිවැය අවශේෂණ ප්‍රකාශය	51
• වැදගත් ගිණුම් ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය	52-57
• අනුපාත විශ්ලේෂණය	58
• සේවක විස්තර වාර්තාව	59

ලංකා ධීවර සංස්ථාව පිහිටුවීම හා නීතිමය ව්‍යුහය

1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ 1964 වසරේදී ලංකා ධීවර සංස්ථාව ස්ථාපිත කරන ලද අතර ව්‍යාපාරික කටයුතු 1965 වසරේදී ආරම්භ කොට ඇත. මූලාරම්භයේදී සංස්ථා අරමුණු වලින් මුළු මහත් ධීවර ක්ෂේත්‍රයම ආවරණය විය. පහත සදහන් කර ඇති ලංකා ධීවර සංස්ථාවේ අරමුණු 1964-10-01 දිනැති හා අංක . 14186 දරණ ලංකාණ්ඩුවේ අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි සඳහන්ව ඇත.

i. නීතිගත සංස්ථාව මගින් කෙලින්ම හා බලයලත් ඒජන්තවරුන් මාර්ගයෙන් ගැඹුරු මුහුදේ ට්‍රෝලර් යාත්‍රා මගින් මසුන් ඇල්ලීම.

11. සංස්ථාව විසින් කෙලින්ම හෝ බලයලත් ඒජන්තවරුන් මාර්ගයෙන් මසුන් සකස් කිරීම (ටින් කිරීම, වේලීම හා සකස්කිරීම) මසුන් අතුරු නිෂ්පාදන කටයුතු

111. සංස්ථාව විසින් කෙලින්ම හෝ බලයලත් ඒජන්තවරුන් මාර්ගයෙන් මසුන් තොග වශයෙන් හෝ සිල්ලරට අලෙවිකිරීම හා බෙදාහැරීම

iv. ශීතාගාර ඇතුලු ධීවර වරායන් හා නැංගුරම් පොලවල් ඉදිකිරීම් නඩත්තු කිරීම

v. මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදනයන් ආනයනය කිරීම හා අපනයනය කිරීම

vi. ධීවර කර්මාන්තය සඳහා ආම්පන්න උපකරණ හා වෙනත් අවශ්‍යෝපකරණ ආනයනය කිරීම හා විකිණීම.

vii. ධීවර දෙපාර්තමේන්තුව හෝ රජයේ වෙනයම් දෙපාර්තමේන්තුවක් වෙනුවෙන් ධීවර කර්මාන්තය සංවර්ධනයට අදාල කටයුතු වල නියැලීම.

viii. ධීවර කර්මාන්තය සඳහා බෝට්ටු හා වෙනත් කුඩා යාත්‍රා තැනීම.

ix. ධීවර බෝට්ටු අලුත්වැඩියාව කිරීමේ හා නඩත්තු කිරීමේ පහසුකම් සැපයීම.

x. ධීවර අවශ්‍යෝපකරණ නිපදවීම හා විකිණීම.

මෙම අරමුණු වලින් සමහරක් දැනට අහෝසි වී ඇති බව සඳහන් කලයුතුය. නමුදු ඉහත සඳහන් ගැසට් පත්‍රයේ සඳහන් wxl (v) දරණ අරමුණු 2011-06-30 දිනැති හා අංක 1712/21 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් සංශෝධනය කරමින් පහත සඳහන් අරමුණු ආදේශ කිරීමට කටයුතු කර ඇත.

i. ස්වසම්පත් කලාපය සහ පිළිගත් ජාත්‍යන්තර රීතිවලට අනුකූලව ඉන් පිටත මසුන් ඇල්ලීමේ මෙහෙයුම්වල නිරතවීම

11. මත්ස්‍ය පිරිසැකසුම පහසුකම් සැලසීම.

111. දේශීය සහ විදේශීය වෙළඳපොල මසුන් විකිණීම.

iv. අවශ්‍ය යැයි හැඟීයන අවස්ථාවන්හිදී මසුන් සහ මත්ස්‍ය නිෂ්පාදන ආනයනය සහ අපනයනය කිරීම

v. ඉහත සඳහන් කටයුතුවලින් යම් කටයුත්තක් සිදුකිරීම සඳහා දේශීය සහ විදේශීය ආයෝජකයින් සමග හවුල් ව්‍යාපාර ගිවිසුම්වලට ඇතුල්වීම.

vi. දේශීය සහ විදේශීය නිෂ්පාදකයා හා බෙදාහරින්නන් නියෝජනය කිරීම

සාංගමික තොරතුරු

සංස්ථාවේ නම	:-	ලංකා ධීවර සංස්ථාව
නෛතික ස්වාභාවය	:-	රාජ්‍ය සංස්ථාව
සංස්ථාපනය කරන ලද දිනය	:-	1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ 1964 ඔක්තෝම්බර් මස 1 වන දින

අධ්‍යක්ෂවරුන් :-

එන්.එච්.මහිල්.පී.සේනාරත්න මහතා	-	සභාපති 2014.11.25 දක්වා
ශාන්ත හේරත් මහතා 2014.12.31දක්වා	-	වැ.බ. සභාපති 2014.11.26 සිට
ශාන්ත හේරත් මහතා	-	උප සභාපති 2014.11.25 දක්වා
එම්.ජ්.බී.රුචිත කුරේරා		උප සභාපති
සඳරුවන් ලංකේෂ්වර මහතා	-	කළමනාකාර අධ්‍යක්ෂක 2014.11.25 දක්වා
එම්.එස්.එම්.ප්‍රනාන්දු	-	කළමනාකාර අධ්‍යක්ෂක 2014.11.25 සිට 2014.12.31දක්වා
දර්ශනා සේනානායක මිය	-	අධ්‍යක්ෂ - මහා භාණ්ඩාගාර නියෝජිත 2014.11.24 දක්වා
එච්.යසලාල් පෙරේරා මහතා	-	අධ්‍යක්ෂ 2014.11.24 දක්වා
ඩැනී.ප්‍රනාන්දු මහතා	-	අධ්‍යක්ෂ 2014.11.24 දක්වා
එම්.එච්.එම්.ජෙලාල්ඩීන් මහතා	-	අධ්‍යක්ෂ 2014.11.24 දක්වා
උපුල් චමින්ද පෙරේරා කුමාරසිංහ මහතා	-	අධ්‍යක්ෂ 2014.11.25 සිට 2014.12.31දක්වා
වී.ආර්.ජ්.සේනක චාමින්ද	-	අධ්‍යක්ෂ 2014.11.25 සිට 2014.12.31දක්වා

ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය

පුරප්පාඩු	-	සාමාන්‍යාධිකාරී
ඩී.එස්.ඩබ්.ජ්.ආර්.පෙරේරා මහතා	-	පරිපාලන කළමනාකාර
ජේ.එම්.ජ්.යූ.ඩබ්.බී.ජයසුන්දර මහතා	-	මුදල් කළමනාකාර
ටී.ඩී.ප්‍රියන්ත මහතා	-	ප්‍රධාන අභ්‍යන්තර විගණක
කේ.වී.එච්.බණ්ඩාරනායක මහත්මිය	-	නීති නිළධාරිනී/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්
පී.කේ.අනුරාධ මනරංජන මහතා	-	මෙහෙයුම් කළමනාකාර
ඊ.ජ්.එස්.එදිරිසිංහ මහතා	-	වැ/බ සේවක මණ්ඩල කළමනාකාර
අයි.එස්.හෙට්ටිහේවා මහත්මිය	-	සිවිල් ඉංජිනේරු

ලියාපදිංචි කාර්යාලය :- නො. 15, රොක්හවුස් පටුමග, කොළඹ -15.
විගණකවරුන් :- විගණකාධිපති
බැංකු කරුවන් :- ලංකා බැංකුව
මහජන බැංකුව

දැක්ම

ධීවර නිෂ්පාදකයාගේ හා පාරිභෝගිකයාගේ සුභසිද්ධිය උදෙසා ධීවර නිෂ්පාදන හා අලෙවි ප්‍රවර්ධන කිරීම සහ මග පෙන්වීමේ ප්‍රමුඛතම වාණිජමය ආයතනය බවට පත්වීම.

මෙහෙවර

- ඵලදායී සංවිධානයක් වශයෙන් දළ දේශීය නිෂ්පාදනයට උපරිම දායකත්වය ලබාදීම.
- මසුන් නිෂ්පාදනය , සැකසුම් කිරීම හා අලෙවි කිරීම සඳහා වගකීමෙන් හා සැලකීමෙන් යුක්ත අර්ථාන්විත ආයතනයක් වීම.
- ධීවර කාර්මිකයාගේ ආර්ථික හැකියාව ශක්තිමත් කිරීම හා එහි නිෂ්පාදන ධාරිතාව නගා සිටුවීම මත ඉහළ සංවර්ධනයක් ලබාගැනීම
- නවීන තාක්ෂණය යොදාගනිමින් සාධාරණ මිලකට උසස් තත්වයෙන් යුත් මසුන් සහ වටිනාකම එකතු කරන ලද නිෂ්පාදනයන්හි නිෂ්පාදන කටයුතුවල හා අලෙවි කටයුතුවල නිරතවීම

ගරු ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා වෙත භාරදෙන ලද ලිපිය

අංක. 15, රොක් හවුස් පටුමග,
මෝදර, කොළඹ 15.
2018 ජූලි 23

ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මැතිතුමා,
ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍ය,
ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය,
නව මහලේකම් කාර්යාලය,
මාලිගාවත්ත,
කොළඹ - 10.

ගරු අමාත්‍යතුමනි,

1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (ඇ) වගන්තිය සහ 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික නිතිගත සංස්ථා පනතේ 30 (1) වගන්තිය ප්‍රකාරව මා විසින් 2014 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලංකා ධීවර සංස්ථාවේ වාර්ෂික වාර්තාව මේ සමග ඉදිරිපත් කරමි.

1. අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

2. 2014 දෙසැම්බර් මස 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

3. 2014 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය.

4. 2014 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණකාධිපතිගේ වාර්තාව

5. විගණකාධිපති වාර්තාව සඳහා ලංකා ධීවර සංස්ථාව විසින් සපයන ලද පිළිතුර

මෙම වාර්තාව ගරු අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

මෙයට විශ්වාසී වූ,

හේමාල් ගුණසේකර
සභාපති
ලංකා ධීවර සංස්ථාව

සභාපතිගේ සමාලෝචනය

ශ්‍රී ලාංකීය මසුන් අලෙවියේ නිරත එකම රාජ්‍ය ආයතනය වන ලංකා ධීවර සංස්ථාවේ මූලික වගකීම ධීවර ප්‍රජාවගේ ජීවන තත්වය උසස් කිරීමට දායකවීම සහ පාරිභෝගික ජනතාව වෙත සාධාරණ මිලට මසුන් ලබාගැනීමට හැකි පරිසරයක් නිර්මාණය කිරීම වේ. මෙහිදී සමාජයේ සෑම ජනකොටසකම සිය ආදායම් මට්ටම අනුව මසුන් මිලදීගැනීමේ පහසුකම් සලසාදීම හා ඒ තුලින් ජනතාවගේ ප්‍රෝටීන් අවශ්‍යතාවය සපුරාලීමෙන් හා ඔවුන්ගේ ජීවන වියදම් පහත දැමීමට සෘජුවම දායකවීම යනාදී ඉලක්ක සපුරා ගැනීම සඳහා මසුන් අලෙවියේ සංස්ථාවට අයත් වෙළඳපොල කොටස වැඩිකර ගැනීමේ අවශ්‍යතාවය සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත.

දිවයිනේ යුද්ධමය වතාවරණය පහවී යාමත් සමග ධීවර කර්මාන්තය සීඝ්‍රලෙස දියුණු වෙමින් පවත්නා තත්වය යටතේ ලංකා ධීවර සංස්ථාව වෙතද රජයේ ආයතනයත් ලෙස සුවිශේෂ කාර්යභාර්ය පැවරී ඇත. එමෙන්ම මසුන් අලෙවිය විවෘත වෙළඳපොල තරගකාරීත්වය මත තීරණය වන්නක් බැවින් සංස්ථාව විසින් කළමනාකරණ උපායමාර්ග වන මිලප්‍රතිපත්තිය , භාණ්ඩ (මසුන් වර්ග) ප්‍රභේදයන්, වෙළඳපොල විවිධාංගීකරණය, අලෙවි ප්‍රවර්ධනය යනාදී කළමනාකරණ උපාය මාර්ග තරගකාරීත්ව වෙළඳපොල ජයග්‍රහණය කරගැනීම සඳහා සාර්ථකව දියත් කොට ඇත.

1. **<u>මසුන් මිලදීගැනීම හා අලෙවිය</u>**

ධීවර ප්‍රජාවගේ මසුන් අස්වැන්න සෘජුවම සංස්ථාවට මිලදීගත හැකිනම් වඩා හොඳ මිලක් ඔවුන්ට ලබාදීමට හැකියාව ඇත. එමෙන්ම ඒ තුලින් පාරිභෝගිකයා වෙත තත්වයෙන් උසස් මසුන් අඩුමිලට ලබාදීමට හැකිවනු ඇත. මෙය සංස්ථාවේ දියුණුවටද සෘජු බලපෑමක් වේ. යාපනය , පේසාලේ පේදුරුතුඩුව සහ ත්‍රිකුණාමලය යන ප්‍රදේශවල මසුන් අස්වැන්න මිලදීගැනීමේ වැඩපිළිවෙල ව්‍යාප්ත කිරීම හා එම ප්‍රදේශවල වෙසෙන ධීවර ප්‍රජාවගේ ජීවන තත්වය ඉහල නැංවීම උදෙසා ධීවර ගම්මානවලට ගොස් ධීවර ප්‍රජාව හමුවී සාකච්ඡා පවත්වා සාර්ථක ක්‍රියාමාර්ග ගන්නා ලදි. එමෙන්ම වර්ෂය තුලදී නව මිලදීගැණුම් මධ්‍යස්ථාන ස්ථාපිත කොට සංස්ථාවේ මසුන් මිලදීගැනීම වැඩිකරගැනීමට පියවර ගෙන ඇත. ඒ අනුව **2014** වර්ෂය තුලදී මෙ.ටො. **4095** ක මසුන් තොගයක් සංස්ථාව මිලදීගත් අතර මෙය සෘජු මිලදීගැණුම් මෙ.ටො. **3136** ක් , විදේශීය යාත්‍රා සමාගම් වෙතින් මෙ.ටො. 873 සහ ආනයනය කිරීම් තුලින් මෙ.ටො. **86** ලෙස සමන්විත වේ.

පැලියගොඩ නවීන අංගෝපාංග වලින් හා වඩාත් පුළුල් වූ පහසුකම් වලින් සමන්විත ඇති නවීන මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණය ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ සෘජු මගපෙන්වීම හා ආශිර්වාදය යටතේ පත්කරන ලද කළමණාකරණ භාරය විසින් පාලනය වන අතර මෙහි කළමනාකරණ කටයුතු ලංකා ධීවර සංස්ථාව විසින් ඉටුකරනු ලබයි. එමෙන්ම මෙහි ඇතුලත් පතුරු අයිස් යන්ත්‍රාගාරය සහ ශීතාගාරයද ලංකා ධීවර සංස්ථාවේ අධීක්ෂණය යටතේ පවත්වාගෙන යනු ලැබේ.

2014 වර්ෂයේදී ලංකා ධීවර සංස්ථාව මසුන් මෙ.ටො. 3819 ක් සිය අලෙවිසැල් ජාලය ජංගම රිය අලෙවි ව්‍යාපෘතිය, ලංකා ස.තො.ස හා කෝප් සිටි අලෙවිසැල් සහ රජයේ රෝහල් මසුන් සැපයීම තුලින් අලෙවිකර ගැනීමට හැකියාව ලැබුණි.

2. **<u>අයිස් නිෂ්පාදනය හා අලෙවිය</u>**

ලංකා ධීවර සංස්ථාවේ තවත් එක් ආදායම් උත්පාදන අංශයක් අයිස් නිෂ්පාදනය හා අලෙවිය අනුරාධපුරය, බේරුවල, හම්බන්තොට පැලියගොඩ සහ මෝදර අයිස් යන්ත්‍රාගාරවල නිෂ්පාදනය තුලින් මෙ.ටො. 10450 ක අලෙවිය ලගා කර ගැනීමට හැකිවිය. නමුත් ගාල්ල අයිස් යන්ත්‍රාගාරයේ සිදුවූ ආපදා තත්වය හේතු කොට ගෙන අයිස් අලෙවිය 50%ත් පමණ අඩු වී ඇත.

3. **<u>විදේශීය මසුන් යාත්‍රා මෙහෙයුම් ක්‍රියාවලිය</u>**

සමාලෝචිත වර්ෂය තුලදී විදේශයාත්‍රා සමාගම් විසින් ගොඩබාන ලද මසුන් තොගයෙන් සංස්ථාවට විශාල ආදායමක් ලබාගැනීමට හැකියාව ලැබුණි. එකග වූ මිලකට යටත්ව සංස්ථාව වෙත එකී සමාගම් විසින් ගොඩබාන මසුන් තොගයෙන් 10% ක ප්‍රමාණය ලෙස මෙ.ටො. 873 ක් වර්ෂය තුලදී ලබාදී තිබුණි.

4. **<u>මසුන් ටින්කිරීමේ ව්‍යාපෘතිය</u>**

ලංකා ධීවර සංස්ථාව සහ සී/ස හැපිකුක් ෆුඩ් ලංකා (පුද්) සමාගම අතර ඒකාබද්ධ ව්‍යාපෘතියක් ලෙස ගාල්ල ලංකා ධීවර සංස්ථා පරිශ්‍රයේ පවත්වාගෙන යනු ලබන ටින්කල මසුන් නිෂ්පාදන කර්මාන්තය CEYFISH වෙළඳනාමය යටතේ නිෂ්පාදන කටයුතු සිදුකරනු ලැබේ.

සේවාවන්

5. **<u>ශීතාගාර පහසුකම් සහ සැකසුම් පහසුකම් සැලසීම</u>**

මෝදර පිහිටි ප්‍රධාන ශීතාගාරය සංස්ථා මසුන් අලෙවියේ කේන්ද්‍රස්ථානය වේ. එමෙන්ම ශීතාගාර ගබඩා පහසුකම් , සැකසුම් ප්‍රදේශ පහසුකම් සංස්ථා විධායකයන් වෙත මෙන්ම බාහිර පාර්ශවයන් වෙතද ලබාදෙන ලදි.

6. **<u>සංචාරක බංගලා පහසුකම්</u>**

නුවරඑළිය, කළමැටිය සහ මින්නේරිය නගරයන්හි පිහිටි සංස්ථාවට අයත් නවීන පහසුකම් වලින් සමන්විත සංචාරක බංගලා තුලින් ආකර්ෂනීය හා පළපුරුදු කාර්ය මණ්ඩලයක සේවය මහජනතාව වෙත ලබාදීමට පියවර ගෙන ඇත.

7. **<u>ලාභාලාභ</u>**

සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවේ සමස්ථ මෙහෙයුම් කටයුතු වලින් රුැ.මිලියන 119.19 ක ශුද්ධ අලාභයක් වාර්තා වී ඇත. පසුගිය වර්ෂයේ අලාභය රුැ.මිලියන 54.45 කි.

හේමාල් ගුණසේකර
සභාපති

අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව එම කාලසීමාව සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනද සමග ලංකා ධීවර සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය ඉතා සතුටින් ඉදිරිපත් කරසිටි.

ලංකා ධීවර සංස්ථාව 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ 1964 වර්ෂයේදී පිහිටුවන ලදි.

ලංකා ධීවර සංස්ථාව ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ පවත්නා අතර සංස්ථාව විසින් 2014 වර්ෂය තුලදී කරගෙන යනු ලැබූ කටයුතු පහත ආකාරයට සංක්ෂිප්ත කර දැක්විය හැකිය.

- දේශීය වශයෙන් මසුන් මිලදීගැනීම හා ආනයනය කිරීම
- තොග සහ සිල්ලර පදනම මත මසුන් අලෙවිකිරීම
- මත්ස්‍ය අතුරු නිෂ්පාදන මිලදීගැනීම සහ අලෙවිය
- අයිස් නිෂ්පාදනය සහ අලෙවිය
- ශීතාගාර පහසුකම් සැපයීම
- KEYFISH වෙළඳනාමය යටතේ නිෂ්පාදිත ටින්කල මසුන් අලෙවිය.

<u>ව්‍යාපාරික කටයුතු සමාලෝචනය</u>

සංස්ථාවේ සමස්ථ මෙහෙයුම් කටයුතු පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ඇතුලත් සභාපතිගේ සමාලෝචනය මෙම අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාවේ වැදගත් කොටසක් ලෙස සැලකිය යුතුවේ.

<u>මූල්‍ය ව්‍යුහය</u>

පසුගිය වර්ෂ කිහිපය තුල සංස්ථාවේ සමස්ථ ආදායම රු.බිලියන දෙකකට ආසන්න වටිනාකමක් වන අතර සමස්ථ ආදායම වැඩිවීමට දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කල මසුන් අලෙවිසැල් ස්ථාපිත කිරීමේ වැඩ පිළිවෙල සෘජු දායකත්වය දරා ඇත. සමස්ථ ශුද්ධ ලාභාලාභ පිළිබඳ සැලකිල්ලට ගැනීමේදී, 2011, 2012 හා 2013 වර්ෂ සැලකිය යුතු ලෙස පිළිවෙලින් රු.මිලියන 68.97 රු.මිලියන 41.76 රු. මිලියන 54.45 වූ අතර 2014 වර්ෂයේදී රු. මිලියන 119.19 ක් දක්වා ශුද්ධ අලාභයේ
වැඩිවීමක් පෙන්නුම් කෙරේ.

සාරාංශගත මූල්‍ය ප්‍රතිඵල විශ්ලේෂණ වාර්තාව පහත දක්වා ඇත.

සමස්ථ ආදායම හා ලාභ/අලාභ විස්තරය

වර්ෂය	සමස්ථ ආදායම රු.මිලියන	දළ ලාභය රු.මිලියන	ශුද්ධ ලාභ/අලාභ රු.මිලියන
2009	912	258.48	(103.90)
2010	1309	384.16	(59.40)
2011	1977	605.17	(68.97)
2012	2079	701.19	(41.76)
2013	1940	657.36	(54.45)
2014	1855	563.26	(119.18)



කාර්ය මණ්ඩලය

විධායක නිලධාරීන්	-	67
කළමනාකාරිත්ව පුහුණු	-	01
තාක්ෂණික නිලධාරීන්	-	695
කණිෂ්ඨ සේවකයින්	-	465
		1228

සුභසාධන කටයුතු

- සිංහල හා හින්දු අළුත් අවුරුදු උත්සවය වෙනුවෙන් සංස්ථාවේ සියළුම සේවකයින් වෙත තොම්ලේ මසුන් කිලෝ දෙකක් බැගින් ලබාදෙන ලදි.
- ඩී.එස්. ජයසිංහ ආයතනය මගින් සහන මිලට ඇස් කණ්නාඩි ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සැලැස්වීම.

<u>විනය ක්‍රියාමාර්ග</u>

සේවයෙන් පහකිරීම් සංඛ්‍යාව	-	**02**
නැවත සේවයේ පිහිටුවීම් සංඛ්‍යාව	-	**02**

<u>විධායක තනතුරු සඳහා බඳවාගැනීම්</u>

යාන්ත්‍රික ඉංජිනේරු (කොන්ත්‍රාත්)	-	01
කළමනාකාරිත්ව පුහුණු	-	01
පද්ධති කළමනාකාර	-	01

<u>විධායක තනතුරේ සේවයෙන් ඉවත්වීම</u>

විශ්‍රාම යාම	-	ගණකාධිකාරි (1 ශ්‍රේණිය)	-01
		විධායක කළමනාකාර (විශේෂ ශ්‍රේණිය)	-01
ඉල්ලා අස්වීම	-	කළමනාකාර (111 ශ්‍රේණිය)	-01
		අලෙවි කළමනාකාර (කොන්ත්‍රාත්)	-01

<u>ගිවිසුම් සඳහා අධ්‍යක්ෂවරුන්ගේ බැඳීම</u>

ලංකා ධීවර සංස්ථාවේ මෙහෙයුම් කටයුතුවලට අදාල කිසිදු ගිවිසුමක් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ කිසිදු බැඳීමක් නොමැත.

<u>ස්තුතිකිරීම</u>

සංස්ථාවේ වර්ධනය සහ සාර්ථකත්වය උදෙසා ගරු ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමන් විසින් ලබාදෙන ලද සියලු වටිනා උපදෙස් ,සහයෝගය සහ මගපෙන්වීම් පිළිබඳව සංස්ථාවේ අධ්‍යක්ෂක මණ්ඩලය සිය ස්තුතිය පළකර සිටී. ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් ඇතුළු සියළුම නිලධාරීන් විසින් ලබාදුන් වටිනා දායකත්වය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හෘදයාංගම අගය කර සිටී. මෙම වර්ෂය තුළදී අපවෙත ලබාදෙන ලද සහයෝගය පිළිබඳව මුදල් අමාත්‍යාංශයේ සහ මහා භාණ්ඩාගාරයේ සියළු නිලධාරීන්හට අපගේ ස්තුතිය පළකර සිටිමු.

අපගේ වටිනා සම්පත වනුයේ සමස්ථ සේවක පිරිස වන අතර වර්ෂය තුළදී ඔවුන් ලබාදුන් සේවය සහ සහයෝගය පිළිබඳව සමස්ථ කාර්ය මණ්ඩලය වෙත අපගේ ස්තුතිය පළකර සිටිමු.

අපගේ වටිනා පාරිභෝගිකයන් . රාජ්‍ය ආයතන වෙතද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තම ස්තුතිය ප්‍රකාශකර සිටින අතර ලංකා බැංකුව විසින් නිරන්තරයෙන් දක්වන ලද ඔවුන්ගේ සහයෝගය සහ අප කෙරෙහි දක්වන ලද විශ්වාසය පිළබඳව ලංකා බැංකු වෙත විශේෂ ස්තුතිය පළකර සිටිමු.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No.: එෆ්එල්එස්/ඒ/සීඑෆ්සී/1/14/15
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2016 අගෝස්තු 11 දින

18 AUG 2016

සභාපති,

ලංකා ධීවර සංස්ථාව.

ලංකා ධීවර සංස්ථාවේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

යථෝක්ත වාර්තාව මේ සමග එවා ඇත.

එච්.එම්. ගාමිණී විජේසිංහ

විගණකාධිපති.

පිටපත් : 1. ලේකම් - ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය.

2.ලේකම් - මුදල් අමාත්‍යාංශය.

Mr. Samanthalal (Accountant)
p/s take necessary action.
8/9

Ms Achala
Keep this with you
2016/9/08

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } එෆ්එල්එස්/ඒ/සිඑෆ්සි/1/14/15   ඔබේ අංකය / உமது இல. / Your No. }   දිනය / திகதி / Date } 2016 අගෝස්තු 11 දින

සභාපති,

ලංකා ධීවර සංස්ථාව.

ලංකා ධීවර සංස්ථාවේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සි) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ලංකා ධීවර සංස්ථාවේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තිරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 29 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සි) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සංස්ථාවේ සභාපති වෙත යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ.තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම්ද ඇතුළු විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනුය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ලංකා ධීවර සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාව දිගින් දිගටම අලාභ ලැබීම, ශුද්ධ වත්කම්වලට අහිතකර ලෙස බලපෑම නිසා භාණ්ඩාගාරයේ හෝ රජයේ වෙනත් මූල්‍ය සහායක් නොමැතිව සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාම අවිනිශ්චිත බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) සංස්ථාවේ පවතින දැඩි මූල්‍ය දුෂ්කරතාවය සඳහා සහන ලබාගැනීම වෙනුවෙන් අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව සංස්ථාවේ අතිරික්ත කාර්ය මණ්ඩලයට මාස හයක කාලයක් රජයෙන් වැටුප් ගෙවීමට තීරණය කර තිබුණි. තවද සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මහා භාණ්ඩාගාරය විමසා, ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැනීමේ යෝජනා ක්‍රමයක් සකස් කොට විෂය භාර අමාත්‍යවරයා මගින් අමාත්‍ය මණ්ඩලය වෙත සලකා බැලීම සඳහා ඉදිරිපත් කළ යුතු බවටද අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබුණි.

2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත දැක්වෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 07

(i) සමාලෝචිත වර්ෂය තුළ මසුන් අලෙවිසැල් ස්ථාපනය කිරීම සඳහා මුදලින් දරනු ලැබූ රු. 4,705,413 ක් වූ වියදම් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුල දක්වනවා වෙනුවට, ප්‍රවර්තන වර්ෂයට අදාල ක්‍රමක්ෂය ගැලපීම් කිරීමෙන් පසුව රු.3,164,389 ක් වූ ශුද්ධ අගය ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලායෑමක් ලෙස දක්වා තිබුණි.

(ii) විලම්භිත ආදායම් ලෙස නිවැරදි විය යුතු රු.24,914,759 ක් ක්‍රමක්ෂය මත ක්ෂයවීම් ලෙස සටහන් කර තිබුණි.

(iii) වර්ෂය තුල ප්‍රාග්ධන නොනිමි වැඩ වෙනුවෙන් මුදලින් දරනු ලැබූ වියදම් පමණක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ගැලපුම් කරනු වෙනුවට පෙර වර්ෂයත්, ප්‍රවර්තන වර්ෂයත් අතර ප්‍රාග්ධන නොනිමි වැඩවල වෙනස වන රු.2,369,269 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුල ගැලපුම් කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 18

ආදායම් හඳුනාගැනීමේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 20

රාජ්‍ය ප්‍රදාන ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 37

සංස්ථාවට එරෙහිව බාහිර පාර්ශවයන් විසින් පවරන ලද නඩු 07 ක් පිළිබඳව තොරතුරු හෙළිදරව් කර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39

මූල්‍ය වත්කම් සහ වගකීම් හඳුනාගැනීම හා මැනීම සඳහා වූ ගිණුම්කරණ ක්‍රමය හෙළිදරව් කර නොතිබුණි.

2.2.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

සංස්ථාවේ විවිධ අලෙවි අංශයන් අතර පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ පදනම ඉකුත් වර්ෂය හා ඒකාකාරීව අනුගමනය කර නොතිබුණි. ඉකුත් වර්ෂයේ පිරිවැටුම පදනම් කරගෙන අලෙවි අංශ වලට පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය කර තිබූ නමුත්, සමාලෝචිත වර්ෂයේ මසුන් අලෙවි අංශයට පමණක් පිරිවැටුමෙන් සියයට 3 ක් වන සේ පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය කර තිබුණි. සංස්ථාව විසින් පොදුකාර්ය පිරිවැය අලෙවි අංශ අතර අන්තර්ග්‍රහණය කිරීමේ පිළිවෙත මූල්‍ය ප්‍රකාශනයන්හි හෙළිදරව් කර නොතිබුණි.

2.2.4 ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව බැංකු ශේෂය රු.415,336 ක් වුවද බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීමේදී සාවද්‍ය ලෙස රු.825,336 ක් ලෙස දක්වා තිබුණි. ණයගැතියන්ගෙන් ලද ඍජු ලැබීම් රු.410,000 ක් ගිණුම්ගතකර නොමැති බව පසුව අනාවරණය විය.

2.2.5 පැහැදිලි නොකළ වෙනස්කම්

මූල්‍ය ප්‍රකාශන අනුව මසුන් අලෙවි ණයගැතියන් හා ශීතාගාර ණයගැති ශේෂ, අදාල උප ලේඛනයන්හි දැක්වෙන ශේෂ සමග සැසඳීමේදී පිළිවෙලින් රු. 34,121,463 ක හා රු.718,755 ක වෙනසක් විය.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයේදී සමස්ථ වෙළඳ ණයගැති ශේෂය රු.294,107,499 ක් වූ අතර ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී සියයට 17 කින් වැඩිවී තිබුණි. මෙම ණය ශේෂ අතර අවුරුදු 05 ඉක්මවූ ණය ශේෂය රු.23,656,885 ක් විය. විශාල ලෙස ණය ශේෂ ඉහල යෑම හා දීර්ඝ කාලීනව ණය ශේෂ පැවතීම තුලින් ණය පාලනයේ හා ණය අය කර කරගැනීමේ දුර්වල බව නිරීක්ෂණය විය.

(ආ) වෙළඳ ණයගිමි කාල විශ්ලේෂණය අනුව වර්ෂ 1 සිට වර්ෂ 3 දක්වා වූ ණයගිමි ශේෂය රු.16,885,327 ක් හා වර්ෂ 3 ට වැඩි ණයගිමි ශේෂය රු.28,052,788 ක් වූ අතර එම ශේෂ නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානය වන විට ලැබිය යුතු හිඟ කුලී ආදායම වූ රු.105,668,736 ක් වූ අතර ඉන් වසරකට වඩා වැඩි පැරණි ණය ශේෂය රු.6,502,980 ක් විය.

2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 177	යොමුගත රෙගුලාසිය අනුව එකතුකර ගන්නා රජයේ මුදල් දෛනිකව ප්‍රේෂණය කළ යුතු වුවද එකතුව රු.170,870 ක් වූ ආදායම දින 2 සිට දින 10 දක්වා කාල පරාසයක් ප්‍රමාදව බැංකුගත කර තිබුණි.
(ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 ඡේදය	චක්‍රලේඛයේ උපදෙස් වලට පටහැනිව සංස්ථාවට අයත් නොවන වාහන තුනක් වෙනුවෙන් රු.316,000 ක ඉන්ධන වියදම් දරා තිබුණි.
(ඇ) 2013 ජනවාරි 15 දිනැති අංක 1/2013 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	අනුමත සේවක සංඛ්‍යාවෙන් පරිබාහිරව හා චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව අවුරුදු 71 ඉක්මවූ නිලධාරියෙකු ජ්‍යෙෂ්ඨ උපදේශක තනතුරක් සඳහා 2013 මාර්තු 15 දින සිට රු.50,000 ක මාසික දීමනාවකට බඳවාගෙන තිබුණි. 2013 මාර්තු 15 දින සිට 2014 දෙසැම්බර් 31 දක්වා දීමනා ලෙස රු.1,150,000 ක් හා ඉන්ධන හා ප්‍රවාහන දීමනා ලෙස 2013 මාර්තු සිට 2014 දෙසැම්බර් දක්වා එකතුව රු. 2,338,626 ක් ගෙවා තිබුණි.

3 . මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.119,187,790 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.54,446,218 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.64,741,572 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. විකුණුම් ආදායම් රු.853,293,687 කින් වැඩිවී භාණ්ඩාගාර ප්‍රතිපාදන රු.47,395,965 ක් ලැබී තිබුණද විකුණුම් පිරිවැය රු.947,392,426 කින් වැඩිවීම හා ක්‍රියාකාරී නොවන ආදායම් රු.16,729,938 කින් අඩුවීම ඉහත පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පසුගිය වර්ෂ 6 ක් තුල ලබා ඇති ශුද්ධ අලාභය රු.මිලියන 384 ක් වූ අතර ,සමාලෝචිත වර්ෂය අවසානයේදී ශුද්ධ අලාභය රු.මිලියන 119 ක් විය. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී ශුද්ධ අලාභය සියයට 120 කින් වැඩිවී තිබුණි.

(ආ) සංස්ථාවේ ජංගම අනුපාතය 0.76:1 ක් හා ක්ෂණික අනුපාතය 0.64:1 ක් වීම හේතුවෙන් සංස්ථාව උග්‍ර කාරක ප්‍රාග්ධන අර්බුදයකට මුහුණ දී ඇති බව නිරීක්ෂණය විය .

(ඇ) සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ මසුන්, අයිස්, ශීතාගාර හා ටින්කල මසුන් යන අංශයන්හි දළ ලාභ ආන්තිකය හා ශුද්ධ ලාභ ආන්තිකය පහත පරිදි විය.

විස්තරය	දළ ලාභ ආන්තිකය		ශුද්ධ ලාභ ආන්තිකය	
	2014	2013	2014	2013
	සියයට	සියයට	සියයට	සියයට
මසුන් ආදායම	22.2	45	2.1	(1.3)

7

අයිස් ආදායම	130	294	(84.6)	(12.6)
ශීතාගාර ආදායම	2,733	2,882	(22.5)	(34.7)
ටින්කල මසුන් ආදායම	4.5	1.6	45.2	(3.5)

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) මසුන් ආදායමේ සහ ශීතාගාර ආදායමේ දළ ලාභ ආන්තිකය අඩුවීම සඳහා විකුණුම් පිරිවැය වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

(ii) අයිස් යන්ත්‍රාගාර ක්‍රියාවිරහිත වීම හේතුවෙන් අයිස් නිෂ්පාදනය අඩුවීම, අයිස් ආදායමෙහි දල ලාභ හා ශුද්ධ ලාභ ආන්තිකය අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ අලෙවි අංශයන්හි වියදම් වල පහත දක්වා ඇති අසාමාන්‍ය වැඩිවීම් හා අඩුවීම් නිරීක්ෂණය විය.

(i) ටින්කල මසුන් අංශයේ අලෙවි වියදම් , මූල්‍ය හා වෙනත් වියදම් පිළිවෙලින් සියයට 91.4 ක්, සියයට 99.6 කින් හා සියයට 99.78 කින් අඩුවී තිබුණද, පරිපාලන වියදම් සියයට 174.56 කින් වැඩිවී තිබූ අතර එය ඒකසේවක පිරිවැය වැඩිවීමට බලපා තිබුණි.

(ii) ශීතාගාර අංශයේ මූල්‍ය වියදම් සියයට 73 කින් වැඩිවී තිබුණු අතර එයට ණයපොලී වැඩිවීම බලපා තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

ඉකුත් වසර තුන තුල මසුන් අලෙවි ප්‍රමාණය හා අයිස් අලෙවි ප්‍රමාණය අඩුවී තිබූ අතර පෙර වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මසුන් හා අයිස් අලෙවි ප්‍රමාණ පිළිවෙලින් මෙ.ටො 677 කින් හා මෙ.ටො.16,384 කින් අඩුවී තිබුණි. අයිස් අලෙවි ආදායමේ අඩුවීම රු.මිලියන 71 කි.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේදී හඳුනාගත් අපහරණය කළ යුතු එකතුව රු.5,202,867 ක් වූ වත්කම් අපහරණය කිරීමකින් තොරව මූල්‍ය ප්‍රකාශනවල දිගින් දිගටම දක්වා තිබුණි.

(ආ) සංස්ථාව සතු රු.66,715,516 ක් වටිනා බහුදින ධීවර යාත්‍රා දෙකක් 2010 ජනවාරි 20 දින සිට මාසිකව රු.200,000 ක බදු කුලියකට වසර 2 ක් සඳහා පුද්ගලික ආයතනයකට බදු දී තිබුණද, අදාල ගිවිසුම අත්සන් කර තිබුණේ මාස 06 ක් ප්‍රමාදවී 2010 ජූලි 30 දිනදිය. යාත්‍රා 02 සඳහා 2011 ජනවාරි සිට 2013 නොවැම්බර් දක්වා හිඟ බදු කුලිය රු.6,000,000 ක් අය කරගැනීම සම්බන්ධයෙන් අනුගමනය කළ නීතිමය කටයුතු මන්දගාමී තත්ත්වයේ පැවතුණි.

ඉහත සඳහන් යාත්‍රා දෙක අතරින් එක් යාත්‍රාවක් සමාලෝචිත වර්ෂය තුළදී තරඟකාරී ලංසු කැඳවීමකින් තොරව නැවතත් බදු දී තිබූ අතර ඊට අදාල ආරක්ෂක තැන්පතු ද ලබාගෙන නොතිබුණි. තවද ගිවිසුම අත්සන් කිරීමට ප්‍රථම රු.33,324,776 ක් වටිනා බහුදින ධීවර යාත්‍රාව බදු ගැණුම්කරු සතු කර තිබුණු අතර, 2014 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා යාත්‍රාවට අදාල රු.1,125,000 ක බදු මුදල් නිසි පරිදි අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සංස්ථාව විසින් භුක්ති විඳින අක්කර 09 පර්චස් 15.59 ක් වූ ඉඩම් 08 ක්, වසර 31 ක් තිස්සේ අදාල පාර්ශවයන් වෙතින් නීත්‍යානුකූලව පවරාගැනීමට කළමනාකරණය විසින් කටයුතු කර නොතිබුණි.

(ඈ) ධීවර සංස්ථාවේ සභාපති අමතන ලද 2013 මාර්තු 06 දිනැති අංක එන්පීසී/1/2/6 දරන ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ වැඩසටහන් උපදේශකගේ ලිපිය අනුව ඉදිකිරීම් පිරිවැය රු.මිලියන 15 ක් වූ ත්‍රිකුණාමලය මසුන් අලෙවිසැල 2013 මාර්තු 09 දින සිට සංස්ථාව වෙත පවරාගන්නා ලෙස දන්වා තිබුණද, 2016 ජනවාරි දක්වා පවරාගැනීමට කටයුතු කර නොතිබුණි.

4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 වර්ෂයේ ආරම්භ කරන ලද උම්බලකඩ ව්‍යාපෘතිය 2014 වර්ෂය තුළදී අලාභ ලැබීම හේතුවෙන් වර්ෂය අවසාන වනවිට රු.3,638,311 ක අලාභයක් ලබා තිබුණි. රජය ආනයන තීරුබදු අඩුකිරීම නිසා වෙළඳපල මිල පහළ යාමෙන් මෙම තත්ත්වය ඇති වූ බවත් අධ්‍යක්ෂ මණ්ඩල තීරණයකට අනුව ව්‍යාපෘතිය නතර කර දමා ඇති බවත් සභාපති විසින් විගණනය වෙත දන්වා ඇත.

(ආ) යුරෝපා සංගමය විසින් පනවා ඇති තහනම ඉවත් කරන තුරු ධීවරයන්ගේ අතිරික්ත මත්ස්‍ය අස්වනු මිලදී ගැනීම සඳහා 2014 දෙසැම්බර් 17 දින භාණ්ඩාගාර ප්‍රතිපාදන මත ආරම්භ කර තිබූ ටූනා ව්‍යාපෘතියේ අපේක්ෂිත මිලගණන් වලින් බැහැරව උප සභාපතිගේ අනුමැතිය මත මාළු තොග මිලදී ගැනීම් හා විකිණීම් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.47,359,695 ක අලාභයක් ලබා තිබුණි.

(ඇ) මාළු අලෙවිය සිදුකරන විධායක 32 අතරින් 28 ක් අලාභ ලබන අතර, සමාලෝචිත වර්ෂය තුළ ලබා ඇති මුළු අලාභය රු.180,538,573 ක් විය.

4.4 දෘශ්‍ය අක්‍රමිකතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මසුන් අලෙවිසැල් සඳහා බාහිර පාර්ශවයන්ගෙන් කුලී පදනම මත ලබාගෙන තිබූ ගොඩනැගිලි සඳහා කුලී ගෙවීමේදී සෘජුවම කුලිකරු වෙත නොගෙවා කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණු අලෙවි කළමනාකරුවෙකු වෙත මුදල් චෙක්පත් නිකුත් කර තිබුණි. ඔහු විසින් කුලී ගෙවීමෙන් තොරව ව්‍යාජ බිල්පත් සංස්ථාව වෙත ඉදිරිපත් කර 2013 හා 2014 වර්ෂයන්ට අදාලව රු.2,260,000 ක් වංචනික ලෙස ලබාගෙන තිබුණි.

(ආ) 2011 වර්ෂය තුළදී සිදුවූ වංචාවක් නිසා රු.2,558,029 ක කාඩ්බෝඩ් තොග ඌනතාවය, වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු යුතු ශේෂ යටතේ දක්වා තිබුණද, ඒ සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන මුදල් රෙගුලාසි 103 හා 104 අනුව විනය පරීක්ෂණයක් පැවැත්වීමට හෝ එය අයකරගැනීමට හෝ කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව සංස්ථාවේ අංශ 05 ක මසුන් වෙළඳ තොගවල මෙට්‍රික් ටොන් 915 ක ඌනතාවයක් පැවති අතර, එම ඌනතාවයන් සම්බන්ධයෙන් කළමනාකරණයෙහි අවධානය යොමුවී නොතිබුණි.

4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සංස්ථාවට අයත් බැංකු ගිණුම් 07 ක එකතුව රු.121,979 ක ශේෂය අක්‍රියව පැවතුණි.

4.6 හඳුනාගන්නා ලද පාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කල්බදු මුදල් නියමිත දිනට නොගෙවීම හේතුකොටගෙන සමාලෝචිත වර්ෂයේදී දඩ ලෙස රු.67,771 ක් ගෙවා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාව විසින් බැංකු අයිරා පොළී ලෙස රු.15,286,528 ක් ගෙවා තිබූ අතර ඉන් ක්‍රියාකාරී අංශය සඳහා පමණක් රු.5,403,488 ක අයිරා පොළියක් විය.

4.7 කාර්ය මණ්ඩල පරිපාලනය

සංස්ථාවේ අනුමත සේවක සංඛ්‍යාව 745 ක් වුවද තථ්‍ය සේවක සංඛ්‍යාව 1,228 ක් වූයෙන් 483 ක සේවක අතිරික්තයක් පැවතුණි. අවශ්‍යතාවය නිශ්චිතව හඳුනා නොගෙන අතිරේක සේවකයන් බඳවාගැනීම නිසා අතිරේක පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 සංයුක්ත සැලැස්ම

සංස්ථාව විසින් 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණි. 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.1 වගන්තිය ප්‍රකාරව පාඩු ලැබීමට සාධාරණ හේතු දැක්වීම් සහිතව එම පාඩු තුලනය කරන ආකාරය සහ නැවත පාඩු වැලැක්වීමට ගන්නා ක්‍රියාමාර්ග සහිතව මුදල් අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවද ආයතනය විසින් වසර ගණනාවක සිට පාඩු ලබමින් පැවති නමුත් එම විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. සංයුක්ත සැලැස්ම කාලානුරූපීව සමාලෝචනය කිරීමට කටයුතු කර නොතිබුණ බැවින් සංයුක්ත සැලැස්මේ දක්වා තිබූ ඉලක්ක සපුරාගැනීමට නොහැකි වී තිබුණි.

5.2 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත සංඛ්‍යා හා තථ්‍ය සංඛ්‍යා අතර සියයට 33 සිට සියයට 840 ක් දක්වා වූ පරාසයක සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

5.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2011 සහ 2012 වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

5.4 නොවිසඳී ඇති විගණන ඡේද

පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ලබා දී තිබූ පහත සඳහන් නියෝග ඉටුකර නොතිබුණි.

(අ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු එකතුව රු.83,384,863 ක් වූ ආර්ථික සේවා ගාස්තුව හා බදු ගෙවීම.

(ආ) පෞද්ගලික සමාගමක් සමඟ ඇතිකරගත් බද්ධ ව්‍යාපාරයෙහි ආයෝජනය කර ඇති ඉඩමේ අයිතිය නැවත ලබාගැනීම.

(ඇ) හිඟ ණයගැති ශේෂය අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබූ අතර රු.මිලියන 299.5 ක් වූ ශේෂ සමාලෝචිත වර්ෂය වන විට රු.මිලියන 399.7 දක්වා වැඩිවී තිබීම.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

(අ) මසුන් මිලදී ගැනීම හා අලෙවි කිරීම
(ආ) ගෙවීම් පාලනය
(ඇ) ආදායම රැස්කිරීම .
(ඈ) ගිණුම්කරණය
(ඉ) ස්ථාවර වත්කම් පාලනය
(ඊ) කාර්ය මණ්ඩල පාලනය
(උ) අයවැය පාලනය
(ඌ) ණයහිමි හා ණයගැති පාලනය

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය
கடற்றொழில், நீரியல் வளங்கள் அபிவிருத்தி அமைச்சு
Ministry of Fisheries & Aquatic Resources Development

CEYFISH

ලංකා ධීවර සංස්ථාව
இலங்கை கடற்றொழில் கூட்டுத்தாபனம்
CEYLON FISHERIES CORPORATION

දුරකථනය / தொலைபேசி / Telephone } Chairman +94112523689, +94112540455; General +94112523227, +94112523228

ෆැක්ස් අංකය / தொலை நகல் / Fax No. } +94112523385

මගේ අංකය / எனது இல. / My No. } CFC/FD/AUD/2014

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி. / Date }

විගණකාධිපති දෙපාර්තමේන්තුව
බත්තරමුල්ල
01 FEB 2016
තැපැල් ශාඛාව

2016-01-25

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
අංක 306/72,
පොල්දුව පාර,
බත්තරමුල්ල.

මහත්මයාණෙනි,

<u>ලංකා ධීවර සංස්ථාවේ 2014-දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2)(සි) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව</u>

ඔබගේ අංක AF/B/CFC/1/14/15 හා 2016-01-13 දිනැතිව අපවෙත එවා තිබූ කෙටුම්පත් විගණන වාර්තාවේ සඳහන් කරුණු පිළිබඳව අපගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණ ඇතුලත් වාර්තාව මේ සමග ඉදිරිපත්කරමි.

මෙයට,

විශ්වාසී,

තුසිත ප්‍රියදර්ශන අලුත්පටබැදිගේ
සභාපති
ලංකා ධීවර සංස්ථාව

Received
2016/02/01
(Gayana)

2. මූල්‍ය ප්‍රකාශන

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1. ආයතනයේ අඛණ්ඩ පැවැත්ම

අ.) ඉදිරිපත් කොට ඇති අදහස් දැක්වීමට එකඟවන්නෙමු.

ආ.)ඉදිරිපත් කොට ඇති අදහස් දැක්වීමට එකඟවන්නෙමු.

2.2.2. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

අ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 01

I. සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ජංගම වත්කම් හා ජංගම වගකීම් ද්‍රවශීලතාවය අනුව පෙල ගස්වා ඇත. ඒ අනුව රු. 443,767,494/- ක වෙළඳ හා අනෙකුත් ලැබීම් ජංගම වත්කම් යටතේ ද්‍රවශීලතා අනුපිළිවෙල අනුව සටහන් කර ඇත.

II. එමෙන්ම රු.526,828,188/- ක් වූ වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු වටිනාකම්ද ජංගම වගකීම් යටතේ ද්‍රවශීලතා අනුපිළිවෙල අනුව සටහන් කර ඇත.

iii. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ට අනුව ස්ථාවර වත්කම් ක්ෂයවීම් විස්තීරණ ආදායම් ප්‍රකාශනයෙහි සටහන් යටතේ හෙළිදරව් කොට ඇත. එමෙන්ම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 20 ට අනුව ලංකා ධීවර සංස්ථාව වෙත ලැබුණු ප්‍රදාන ක්‍රමක්ෂය කර ඇත. එයට අදාල වටිනාකම රු.24,914,759/- වර්ෂයට අදාල සම්පූර්ණ ක්ෂයවීම් වටිනාකම රු. 75,631,736/- ක් වූ ගැලපුම් කොට ඇත. එයට අමතරව ලංකා ධීවර සංස්ථාවේ 2015.06.26 දින පැවති අංක 1007 දරණ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී සංස්ථාවේ වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේ අතිරික්තයෙන් සමාලෝචිත වර්ෂයට අදාල ක්ෂයවීම් වටිනාකම වන රු.45,328,629/- ද ගැලපුම් කිරීමට අනුමැතිය ලබාදී තිබුණි.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 20 ට අනුව මූල්‍ය ප්‍රකාශනවල රාජ්‍ය ප්‍රදාන ගිණුම් තැබීම් පිළිබඳව හෙළිදරව් කිරීම සිදුකොට ඇත.

ආ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 05

2012 වර්ෂයේදී ස්ථාවර වත්කම් භෞතිකව පරීක්ෂා කොට ස්ථාවර වත්කම් ලේඛනය නිවැරදිව පිළියෙල කිරීම හා පොදු ලෙජරයේ ස්ථාවර වත්කම් ශේෂය සමග සැසඳීම සිදුකරන ලද අතර එහිදී හඳුනාගත් බැහර කලයුතු වත්කම් වටිනාකම නියමිත ක්‍රමවේදයන් අනුගමනය කරමින් පොත්වලින් ලියාහැරීමට අවශ්‍ය පියවර ගනිමින් පවතී.

ඇ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07

I. සමාලෝචිත වර්ෂය තුල මසුන් අලෙවිසැල් ස්ථාපනය කිරීම සඳහා දරනු ලැබූ වියදම් සහ ඒ වෙනුවෙන් ලැබුණු ප්‍රදාන ගැලපුම් කොට ශුද්ධ අගය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා ඇත. ඉදිරි වර්ෂයේ සිට මෙහි අගයන් වෙන් වෙන්ව මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශයේ සඳහන් කිරීමට සටහන් කරගතිමු.

II. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 20ට අනුව රාජ්‍ය ප්‍රදාන ක්‍රමක්ෂය කිරීමේදී වර්ෂයට අදාල ක්‍රමක්ෂය වටිනාකම විළම්භිත ආදායමක් ලෙස මෙන්ම ලාභයට ගැලපුම්කොට අඩුකිරීමක් ලෙස සටහන් කිරීම යන ක්‍රම දෙකෙන් එකක් අනුගමනය කරන ලෙස දක්වා ඇත. ඒ අනුව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිප අංක 07 ට අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ක්‍රමක්ෂය කල වටිනාකම නිවරදිව ඉදිරිපත් කොට ඇත.

III. ඉදිරිපත් කර ඇති අදහස් දැක්වීමට එකඟ වන්නෙමු. ඉදිරි වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී ප්‍රාග්ධන නොනිමි වැඩ ශුද්ධ අගයට මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි ඉදිරිපත් නොකර වෙන්වෙන් වශයෙන් අගයන් ඉදිරිපත් කිරීමට සටහන් කරගනිමු.

ඈ. <u>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 12</u>

ලංකා ධීවර සංස්ථාව දීර්ඝ කාලීනව බදු අලාභයන් වාර්තාවී ඇති බැවින් ඉදිරියට ගෙන ආ බදු අලාභය මත විලම්භිත බදු වත්කම් හඳුනාගෙන ඒ සඳහා වෙන් කිරීමක් සිදු නොකරයි. මේ පිළිබඳව සටහනක් මගින් හෙළිදරව් කර ඇත.

ඉ. <u>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18</u>

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක අංක 18 හි නියමයන්ට අනුකූලව ආදායම් හඳුනාගැනීමේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශවල සටහන් යටතේ හෙළිදරව් කර ඇත.

උ. <u>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 20</u>

ඉදිරිපත් කොට ඇති අදහස් දැක්වීමට එකඟවන්නෙමු. ඉදිරි වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල රාජ්‍ය ප්‍රදාන ගිණුම්ගත කිරීම ගිණුම්කරණ ප්‍රතිපත්තිය හෙළිදරව් කිරීමට කටයුතු කරන්නෙමු.

ඌ. <u>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 32 හා 39</u>

I. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 32 හා 39 නියමයන්ට අනුකූලව මූල්‍ය වගකීම් හඳුනාගැනීම හා මැනීම සඳහා වූ ගිණුම්කරණ ක්‍රමය පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරවු කර ඇත.

II. මෙම ආයෝජනයට අදාල බද්ධ ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක නොවූ බැවින් එකී බද්ධ ව්‍යාපාරයට ආයෝජනය කරන ලද ඉඩම් නැවත අත්පත් කරගැනීම සඳහා ඉදිරි නීතිමය ක්‍රියාමාර්ග සිදු කරමින් පවතී. මේ සම්බන්ධයෙන් මූල්‍ය ප්රකාශනවල වෙනම හෙළිදරව් කර ඇත.

එ. <u>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 37</u>

ඉදිරිපත් කොට ඇති අදහස් දැක්වීමට එකඟවන්නෙමු. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 37 ට අනුව සංස්ථාවට එරෙහිව බාහිර පාර්ශ්වයන් විසින් පවරන ලද නඩු සම්බන්ධ අසම්භාව්‍ය බැරකම් වෙනුවෙන් වෙන්කිරීමක් මූල්‍ය ප්‍රකාහනවල සිදුකොට ඇත.

2.2.3 <u>ගිණුම්කරණ ප්‍රතිපත්ති</u>

2013 වර්ෂයඅවසානය දක්වා මධ්‍යගත මෙහෙයුම් මූල්‍ය හා ගිණුම් ක්‍රමවේදය ක්‍රියාත්මක වූ බැවින් වාර්ෂික පිරිවැටුම් පදනම් කොටගෙන මධ්‍යම පරිපාලන පොදු කාර්‍ය පිරිවැය අලෙවි අංශයට අන්තර්ග්‍රහණය කරන ලද නමුත් 2014 වර්ෂයේ සිට විමධ්‍යගත මෙහෙයුම් මූල්‍ය හා ගිණුම් ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම සමග මධ්‍යම පරිපාලන පොදු කාර්‍ය පිරිවැය ආවරණය කරගැනීම සඳහා අලෙවි අංශයේ බාහිර අලෙවියෙන් 03% ක් ප්‍රධාන කාර්‍යාලයට ලබාදිය යුතු බවට වූ තීරණය ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව මේ පිළිබඳව ඉදිරි වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට සටහන් කර ගතිමු.

2.2.4. <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

අ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 නියමයන්ට අනුකූලව සංස්ථාව සතු ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කරන ලද අතර ඒ අනුව සමුච්චිත ස්ථාවර වත්කම් වටිනාකම රු.බිලියන 1.7 දක්වා වැඩිවිය. එමෙන්ම වාර්ෂික ලාභයට ගැලපුම් කලයුතු ස්ථාවර වත්කම් ක්ෂයවීම් වටිනාකම ලාභයට ගැලපුම් කරන ලද්දේ නම් වාර්ෂික ශුද්ධ අලාභය එම වටිනාකමින් වැඩිවනු ඇත. එහෙයින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමෙන් වාර්තා වූ රු.මිලියන 1,288 ක ප්‍රාග්ධන සංචිතයෙන් වර්ෂයට අදාල ස්ථාවර වත්කම් ක්ෂයවීම වටිනාකම කපාහැරීමට පියවර ගෙන ඇත.

ආ. 2015 වර්ෂයේදී මේ පිළිබඳව ගිණුම් සටහන් මගින් නිවරදි කර ඇත.

ඇ. මෙය බැංකු ප්‍රකාශයේ බැංකු ගාස්තු ලෙස සටහන් නොවීම නිසා සිදුවූ වරදකි. එයට අදාලව 2015 වර්ෂයේදී නිවරදි කිරීම් සටහන් තබා ඇත.

ඈ. 1984 වර්ෂයේදී සම්ප්‍රදායනුකූල නොවන මත්ස්‍ය සම්පත් දියුණු කොට ව්‍යාපාරික කටයුතු උතුරු නැගෙනහිර ප්‍රදේශ මුල්කොට ගෙන සිදුකිරීමට ස්ථාපිත කරන ලද බද්ධ ව්‍යාපාරය වර්ගවාදී යුධමය වාතාවරණය යටතේ සම්පූර්ණයෙන්ම නතර කර දමා වසර 20 කට පමණ පසුව පැවති එකම වත්කම් වූ සමාගම නමින් වාණිජ බැංකුවක පැවති මුදල් ශේෂයෙන් සංස්ථාවේ හිමිකාරිත්වය වන 51% ක කොටසට අදාල රු. 373,603/- ආයෝජන ලෙස ගිණුම්ගත කොට එකී බද්ධ ව්‍යාපාරයට වීන රජයෙන් ලැබුණු 6,872,110/- ණය මුදල සඳහා සම්පූර්ණ වෙන්කිරීම් කොට ඇත. මේ වනවිට බද්ධ ව්‍යාපාරය සතු කිසිඳු වත්කමක් පවතින බවට අනාවරණය කරගැනීමට නොහැකි බැවින් සම්පූර්ණ වටිනාකම පොත්වලින් ලියා හැරීමට ඉදිරි පියවර ගනිමින් පවතී.

ඉ. මේ සම්බන්ධයෙන් ඉහත අංක 2.2.2 (ඌ)(ii() යටතේ දක්වා ඇති පිළිතුර අදාල වේ.

2.2.5 නොසැසඳු පාලන ගිණුම්

අ. වෙළඳ ණයහිමියෝ

මූල්‍ය ප්‍රකාහන අනුව සහ උපලේඛන අනුව පෙන්නුම් කර ඇති වෙළඳ ණයහිමි ශේෂ අතර රු.1288,564/- ක වෙනසක් වාර්තාවන බවට සඳහන්ව ඇතත් මූල්‍ය ප්‍රකාශනවල සඳහන් වෙළඳ ණයහිමි ශේෂය රු. 334,174,506/- වන අතර මේ සම්බන්ධ විස්තරය පහත දක්වා ඇත.

	රු.
මත්ස්‍ය අලෙවිය	321,232,659.00
ටින්කල මසුන්	12,954,039.00
අයිස් අලෙවිය	(12,192.00)
මූල්‍ය ප්‍රකාශනවල සඳහන් වටිනාකම	334,174,506.00

ආ. වෙළඳ ණය ගැතියන් යටතේ පෙන්නුම් කෙරෙන වෙනස ඉදිරි වර්ෂයේදී නිරවුල් කිරීමට පියවර ගෙන ඇත.

ඇ. විවිධ ණයගැතියන් යටතේ වෙනස ලෙස පෙන්නුම් කෙරෙනුයේ අහරු චෙක්පතද අදාල වටිනාකමය. එය ණයගැති ශේෂයට එකතු වියයුතු බැවින් වෙනසක් වාර්තා නොවේ.

2.2.3. ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

අ. සමාලෝචිත වර්ෂය අවසානයේ අඩමාණ ණය වෙන්කිරීම් වටිනාකම රු.2,258,388/- ක් ලෙස සඳහන් කොට ඇත්තේ වර්ෂයට අදාල වෙන්කිරීමය. එනමුත් මූල්‍ය ප්‍රකාශනවල සඳහන් නිවරදි සමුච්චිත අඩමාණ ණය වෙන්කරීම් වටිනාකම රු. 32,478,249/- කි.

වෙළඳ හා අනෙකුත් ණය අයකරගැනීම සම්බන්ධයෙන් ගණකාධිකාරී ණය එකතුකිරිම් අංශය කටයුතු කරනු ලබන අතර මේ පිළිබඳව ඉහල කළමනාකාරිත්වය විගණන හා කළමණාකරණ කමිටුව මෙන්ම අධ්‍යාක්ෂ මණ්ඩලය විසින් නිරන්තර අධීක්ෂණය උපදෙස් නිකුත් කරනු ඇත. තවද ඇතැම් ණය අයකරගැනීමට ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශ ලේකම් සෘජුව මැදිහත්ව අවශ්‍ය පියවර ගෙන ඇත. ගෙවීම් පැහැර හැර ඇති ණය අයකරගැනීම සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග මෙන්ම නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත.

ආ. මසුන් අලෙවියට අදාල ණයහිමි කාල විශ්ලේෂණ අනුව අවු.03 කට වැඩි ශේෂ ලෙස පෙන්නුම් කර ඇත්තේ විදේශ යාත්‍රා සමාගම් වෙත ගෙවිය යුතු වටිනාකම හා නීතිමය ක්‍රියාමාර්ග ගෙන අවසන්ව නොමැති ණයහිමි ශේෂයන් වන අතර ඇතැම් විධායක වලට අදාලව ගෙවිය යුතු වටිනාකම පෙන්නුම් කෙරේ. එකී වටිනාකම් කොටස් වශයෙන් අලෙවි අංශයට අයකර ගැනීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර ඇත. අවු. 01 අඩු ණයහිමි ශේෂයන් මේ වනවිට සම්පූර්ණයෙන් ගෙවීම් කොට ඇත.

ඇ. කුඩාමඩුව ඉඩම බදු දීමෙන් ලැබිය යුතුව තිබූ රු. 420,000/- ක හිඟ කුලී වටිනාකම 2015 වර්ෂයේදී සම්පූර්ණයෙන් අයකරගෙන ඇත.

ඇ. සංස්ථාව මුහුණ පා ඇති බරපතල මූල්‍ය අර්බුදය හමුවේ 2010 වර්ෂයට අදාලව හිඟව පවතින සේවක අර්ථසාධක අරමුදල් දායක මේ වනවිටද ගෙවා නොමැත. මෙම මුදල ඇතුළු ව්‍යවස්ථාපිත ගෙවීම් නිරවුල් කරගැනීමට අවශ්‍ය අරමුදල් සම්පාදනය කරගැනීම සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදනයන් ලබාගැනීමට පියවර ගෙන ඇත.

ඉ. සමාලෝචිත වර්ෂය අවසානයේ පැවති අක්‍රිය ණය ගැති ශේෂ වටිනාකම ඇතුලත් විනය ක්‍රියාමාර්ග ගැනීම හා නීතිමය ක්‍රියාමාර්ග ගැනීම් වලට අදාල වටිනාකම් හැර ඉතිරි වටිනාකම් පිළිබඳ විගණන හා කළමණාකරණ කමිටුවේ නිර්දේශ ලබාගෙන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ප්‍රකාරව කටයුතු කරමින් පොත්වලින් ඉවත්කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

ඊ. සමාලෝචිත වර්ෂය අවසානය වනවිට පැවති හිඟ කුලී වටිනාකම අතුරින් රු. මිලියන 3.7 ක මුදලක් 2015 වර්ෂය තුලදී අයකරගෙන ඇති අතර ඉතිරි වටිනාකමට අදාලව කුලීගෙවීම් පැහැර හැර ඇති පාර්ශවයන් වෙත ලිඛිත දැනුම්දීම් කොට අයකර ගැනීමට හා නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත.

2.4. විගණනය සඳහා සාක්ෂි නොවීම

අ. වෙළඳ ණය ගැතියෝ

විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් කොට ඇත.

ආ. විවිධ ණය ගැතියෝ

විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් කොට ඇත.

ඇ. වෙළඳ ණයහිමියෝ

විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් කොට ඇත.

2.2.5 නීති රීති රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම

අ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි අංක 177

වාර්තාවේ සඳහන් දෛනික එකතු කර ගන්නා ලද රු. 170,870/- ක මුදල පසුදින බැංකුගත කරන ලදී.

ආ. 2003 ජූනි 02 දිනැති PED/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 ඡේදය

ලාංකීය ජනතාවගේ ජීවන තත්වය උසස් කිරීම හා මන්දපෝෂණය තුරන් කිරීම මෙන්ම ධීවර ප්‍රජාවගේ ආදායම් මාර්ග වැඩිදියුණු කිරීම යනාදි කරුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා ගරු. ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගේ උපදෙස් හා මග පෙන්වීම වලට අනුව ලංකා ධීවර සංස්ථාව විසින් මසුන් වෙළඳපොලේ මිල පාලනය කොට සහන මිලට මසුන් සැපයීම සඳහා සංස්ථාව සතු මසුන් අලෙවිසැල් ජාලය පුළුල් කිරීම සහ ධීවර ප්‍රජාව හමුවී සාකච්ඡා පවත්වා මසුන් මිලදී ගැනීමේ කටයුතු සම්බන්ධ නව වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම යනාදී කටයුතු වලදී ගරු. අමාත්‍යතුමා සමග කාර්‍ය මණ්ඩලය විශේෂයෙන්ම අමාත්‍යාංශ මාධ්‍ය ඒකකය සහභාගිවන බැවින් ඔවුන් වෙත ලබාදී ඇති වාහනවල ඉන්ධන ලංකා ධීවර සංස්ථාව විසින් ලබා දීමට කටයුතු කරන ලදී.

